# ප්‍රාග් මහින්ද අවධියේ බුදුදහම පිළිබඳ විමසුමක්

කුඩාවැවේ සෝමානන්ද හිමි

අශෝක අධිරාජයාගේ පුත්‍රයා වූ මිහිඳු හිමියන් ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීම සම්බන්ධ පුවත ඓතිහාසික සත්‍යයක් වශයෙන් පුරාවිද්‍යාත්මක සාධක[1] සහ දීපවංශය, මහාවංසය, විනයට්ඨකථාව වන සමන්තපාසාදිකාව ආදී සාහිත්‍යය මූලාශ්‍ර[2] මගින් සනාථ වෙයි.

බුද්ධෝත්පත්තියේ සිට මහින්දාගමනය දක්වා කාල පරිච්ඡේදය තුළ ඉන්දියාවේ විවිධ ප්‍රදේශ සහ ශ්‍රී ලංකාව අතර වූ සබඳතාවන් සම්බන්ධයෙන් එන තොරතුරු මත බුදුදහම පිළිබඳව යම්කිසි පණිවුඩයක් ශ්‍රී ලංකාවට ව්‍යාප්ත වූ බවක් පෙනීයයි. එනමුදු බුදුන්ගේ ලංකාගමනයට අදාළ තොරතුරු හැර මෙරට වැසියන් බුදුදහම පිළිබඳ දැනීමක් මහින්දාගමනයට පෙර ලබා නොතිබූ බව ගෙනහැර පෑමට වංසකථා සහ අනෙකුත් මූලාශ්‍රයන් උත්සහගනු ලැබුව ද එම මූලාශ්‍රයන්ම සුපරීක්‍ෂාකාරීව පරිශීලනය කිරිම මගින් බුදුදහම සම්බන්ධයෙන් යම්කිසි දැනීමක් මහින්දාගමනයට පෙර තිබූ බව තහවුරු කරගත හැක.

ලක්දිව බුදුසසුන පිහිටුවීම සම්බන්ධයෙන් අවධානය යොමුකරන විට බුදුන්ගේ පළමුවැනි ලංකාගමනයෙන් ශ්‍රී ලංකාවෙහි ශාරීරික, පාරිභෝගික වස්තූන්[3] පූජ්‍යත්වයට පත් වූ මුල් අවධිය ලෙස සනිටුහන් වුවද මේ සම්බන්ධයෙන් තොරතුරු ගෙනහැරපාන වංසකථාවලට අනුව පෙනීයන්නේ බෞද්ධාගමේ ස්ථාවරත්වයක් මෙන්ම පැතිරීමක් බුදුන්ගේ ලංකාගමනය තුළින්



සිදු නොවූ බවය. බුදුන් තුන්වතාවක් වැඩම කළත් උන්වහන්සේගේ ශාරිරික මෙන්ම පාරිභෝගික පූජා වස්තූන් ශ්‍රී ලාංකේය ජනතාව හිමිකර ගත්තත් බෞද්ධාගම මේ රට නොපිහිටියේ ද යන්න විද්වත්හු සාකච්ඡාවට[4] බඳුන් කරති.

විජයාගමනයේ සිට මහින්දාගමනය තෙක් වූ සියවස් තුන තුළ ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක වූ ආගමක්, ලේඛන කලාවක්, සාහිත්‍යයක් හෝ කිසියම් දියුණු සංස්කෘතියකින් තොර වූ බව දක්වන වංසකථාකරුවන් මහින්දාගමනයත් සමග මෙරට සංස්කෘතිමය වශයෙන් පෙරලියක් වූ බව දක්වයි.

මහින්දාගමනයට පෙර බුදුන් දිවයිනට තෙවරක් වැඩීම හේතුවෙන් ශ්‍රී ලාංකිකයෝ බුදුදහම පිළිබඳ අවබෝධයකින් විසුවේ යැයි සිතිය හැකිය. දීපවංසය, මහාවංසය විජය ඇතුළු පිරිස ඒමට පෙර දිවයිනෙහි සිටි මිලේච්ඡ ජනයා මර්ධනය කිරීම සඳහා බුදුන් මෙරටට වැඩම කර වූ බව සඳහන් කරයි.[5] පළමුවර බුදුන් මහියංගණයට වැඩම කර අසංඛ්‍ය වූ පිරිසක් තිසරණයෙහි පිහිට වූ සේක. දෙවැනිවර නාගදීපයට වැඩම කොට අසීති කෝටියක් දෙනා සරණ සීලයෙහි පිහිට වූ බවත් සමන්තකූට පර්වතයෙහි බුදුන්ගේ ශ්‍රී පාද ලාඤ්ජනය පිහිටවනු ලැබුවේ තෙවැනිවර කැළණියට වැඩම වූ අවස්ථාවෙහි යැයි කියවේ.[6]

වංසකථාවල එන පරිදි බුදුන්ගේ ලංකාගමනයන් සම්බන්ධ වාර්තා ආශ්චර්ය, අද්භූත විශ්වසනීයත්වයෙන් තරමක් දුරස්ථ ඒවා යැයි එම වාර්තා විමසීමට ලක්කිරීමේ දී පෙනීයයි. එනමුදු සමන්තපාසාදිකාව වැනි වෙනත් ග්‍රන්ථයක් පරිශීලනය කිරීමේ දී එය අතිශයෝක්තියට බර විශ්වසනීයත්වයෙන් තොරවත් ආශ්චර්යයාත්මකවත් දක්වා නැති බවත් පෙනීයයි.[7] කෙසේවුවත් මෙම මූලාශ්‍රයන්හි එන බුදුරදුන්ගේ ලංකාගමනයන් සම්බන්ධයෙන් දක්වන එම වාර්තා ඓතිහාසික වශයෙන් සනාථ කිරීමට නොහැකි වුවද එම පුවත් ගොතන ඒවා යැයි සලකා අසත්‍ය ලෙස සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමට නොහැකිය. මෙකී සිද්ධීන්වල සත්‍යාසත්‍යතාව නිශ්චය කිරීම මෙතරම් මෑත

වකවානුවක දී කිරීමට නොහැකි බව ගුණපාල මලලසේකර මහතා පෙන්වා දෙයි.[8] බුදුන්ගේ ලංකාගමනය සම්බන්ධයෙන් <u>සමන්තපාසාදිකාව</u>, <u>දීපවංශය</u>, <u>මහාවංසය</u> යන ග්‍රන්ථවල පමණක්[9] තොරතුරු සඳහන් වුවද ත්‍රිපිටකාගත වෙනත් ග්‍රන්ථවල කරුණු දක්නට නොමැත. ''ත්‍රිපිටකයෙහි කිසිම තැනක සඳහන් නොවීම නිසා ඇතිවන මේ අභාවාත්මක සාක්‍ෂ්‍යය සැහැල්ලු කොට නොගත යුත්තක් වුවද තීරණයකට පැමිණීමට හෝ මෙම ජනප්‍රවාදයේ සත්‍යය බැහැර කිරිමට හෝ ප්‍රමාණවත් නොවේ. සමහරවිට මේ ජනප්‍රවාදය වීමට හේතුවවන්නට ඇත්තේ මහින්දාගමනයට පෙර දඹදිවින් ඇතැම් බෞද්ධ ධර්ම ප්‍රචාරකයින් මෙරට පැමිණීමත් ලක්දිව ආදිවාසීන් අතරෙහි එනම්, යක්‍ෂ හා නාග ගෝත්‍රිකයින් අතරෙහි බෞද්ධයින් සැළකියයුතු සංඛ්‍යාවක් සිටීමත්'' යැයි සිතිය හැකි යැයි ආචාර්ය ඊ.ඩබ්. අදිකාරම් පවසයි.[10] බුදුන්ගේ පළමු ගමනේ දී මෙරට බුදුදහම දත් කිසිවකු නොවූ බව පිළිගත හැකි නමුදු ඉන් අනතුරුව බුදුදහම සම්බන්ධයෙන් දැනගත් පිරිසක් සිටිය යුතුය.

සිංහල ජාතියේ ආරම්භකයා ලෙස සළකන විජයගේ ආගමනය සම්බන්ධයෙන් ද <u>දීපවංශය</u>, <u>මහාවංසය</u>, <u>සමන්තපාසාදිකාව</u> ආදී සාහිත්‍යය මූලාශ්‍රවල තොරතුරු දක්නට ලැබේ.

<u>මහාවංසයේ</u>[11] විජය ඇතුළු පිරිස බුද්ධ පරිනිර්වාණ දිනයේ ආ බවත් <u>දීපවංශයේ</u>[12] බුද්ධ පරිනිර්වාණය සිදු වූ කාලයට සම්බන්ධ කරමින් ද <u>සමන්තපාසාදිකාවේ</u>[13] එය පරිනිර්වාණ වර්ෂයට සම්බන්ධ කර තිබෙන බවක් පෙනීයාමෙන් මූලාශ්‍රයන්හි පරස්පර විරෝධී බවක් තිබෙන නමුත් සිදුවීම බුද්ධ පරිනිර්වාණයට සමකාලීනව වූ බවක් පෙනීයයි. විජයාගමනයට ප්‍රථමයෙන් සිදුවූ බෞද්ධාගමනයන් ආදිය සැලකිල්ලට නොසළකා හැර දැමුව ද විජයගෙන් අනතුරුව මහින්ද හිමියන් ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දෙන තෙක් වූ කාලපරිච්ඡේදය තුළ බුදුදහම සම්බන්ධයෙන් කුමනාකාර හෝ තොරතුරක් ශ්‍රී ලංකාවට නොලැබුණේ යැයි සිතීමට අපහසුය. යට කී පරිදි විජය ඇතුළු පිරිස ජනපද පිහිටුවා ගැනීම පිණිස ඉන්දියාවේ සිට



දකුණු දෙසට ආ ජන කොටස් අතුරින් ප්‍රබලතම පිරිසක් වියහැකි බව මලලසේකර මහතා පවසයි.[15] එමනිසා එකී පිරිස අතර ස්වල්ප පිරිසක් හෝ මොවුන් අතරින් බුදුදහම සම්බන්ධයෙන් ඉතාම සුළු හෝ දැනීමකින් තොරවූවන් යැයි සිතීම උගහටය.

ඈත අතීතයේ සිට ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ඉතාම කිට්ටු සබඳතාවක් තිබුණු අතර ප්‍රධාන වශයෙන්ම මුලදී වෙළඳම නිසා මෙම සබඳතාවය ඇතිවිය.[16] එසේම නොයෙක් මුහුදු මාර්ග භාවිත කරමින් විජයගේ පැමිණීමත් මිහිඳු හිමියන්ගේ පැමිණීමත් අතර කාලපරිච්ඡේදය තුළ ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර නොයෙකුත් දූත කණ්ඩායම් ආ ගිය බව පැහැදිලිය.

ඒ අනුව විජයගේ බිසවත් සමඟ පවුල් දහසක් ශ්‍රී ලංකාවට ආ බව සඳහන් වේ.[17] වල්පොල රාහුල හිමියෝ බුදුන් ජීවමාන කාලයෙහි මධ්‍ය දේශය තුළ ධර්ම ප්‍රචාරයෙහි යෙදුණු බවත් දකුණු ඉන්දියාවේ විසූ පාණ්ඩ්‍යයන්ගේ මූලය වන්නේ ඉන්දියාවේ මධ්‍ය දේශයෙහි ක්‍ෂත්‍රියන්ගෙන් බවත් ශ්‍රී ලංකාවට පැමිණි ඇතැම් පාණ්ඩ්‍ය පවුල් බුදුදහම පිළිබඳ දැන සිටියා මෙන්ම මෙසේ පැමිණියවුන් අතරින් බෞද්ධයන් වූ බවත් පවසති.[18] එසේම විජය සහ ඔහුගේ පිරිසට බිසෝවරු වීමට පැමිණි දකුණු ඉන්දිය පිරිස අතර බෞද්ධයින් සිටියේ නම් මහින්දාගමනයට පෙර යම්කිසි ස්වරූපයකින් බුදුදහම ශ්‍රී ලංකාවට ලැබී තිබෙන්නට ඇතැයි පැහැදිලිය. වංසකතාවලට අනුව පණ්ඩුවාසුදේවගේ බිසව වූ භද්දකච්චායනා බුදුන්ගේ ඥාති සහෝදරියක වූ බවත් ඇය සමඟ අවිවාහක කුල ස්ත්‍රීන් තිස් දෙදෙනෙකු පැමිණි බවත් පෙනේ.[19] භද්දකච්චායනාගේ පියා වූ සක්කපණ්ඩු රජු සුද්ධෝදන රජුගේ සහෝදරයකු වූ අමිතෝදන ශාක්‍යාගේ පුත්‍රයා ලෙස පෙන්වා දිය හැකිය.[20] ඇගේ සහෝදරයන් හය දෙනෙකු පසුව ලක්දිවට පැමිණ විවිධ ප්‍රදේශයන්හි ජනපද පිහිටුවා ගන්නා ලදි. භද්දකච්චායනා පැමිණියේ පැවිදි වේශයෙන්[21] නිසාත් එම කුමාරිකාව බුදුන්ගේ ඥාතිවරියක වූයේ නම් ඇය ශ්‍රී ලංකාවට පැමිණෙන විට බුදුදහම සම්බන්ධයෙන් යම් යම් තොරතුරු දැනගෙන සිටින්නට

ඇති අතර යම් යම් තොරතුරු ද රැගෙන එන්නට ඇතැයි සිතිය හැක.

ඒ අනුව ඇය සහ ඇගේ සහෝදරයන් බුදුදහම පිළිබඳ යම් යම් තොරතුරු ලක්දිවට හඳුන්වා දෙන්න ඇතැයි සිතීමට අපහසු නොවේ. පඬුවස්ගේ අගබිසව වූ ශාක්‍යවංශික භද්දකච්චායනා ගැන සඳහන් කරන මලලසේකර[22] මහතා පවසන්නේ තම ශ්‍රේෂ්ඨ ඥාතිවරයා ගත් මග ගත්බව පැවසීම කෙරෙහි කිසිදු සැකයක් නැති බවය. මෙමගින් බුදුන්ගේ පරිනිර්වාණයෙන් අනතුරුව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන දෙරට අතර වූ සබඳතාවයන් ඉතාම සමීපව තිබූ හෙයින් මහින්දාගමනයට පෙර කිසියම් ආකාරයක බුදුදහම පිළිබඳ දැනුමක් ලක්දිවට ලැබී තිබූ බව ප්‍රකාශ කළ හැකිය.

පුරාතන ශ්‍රී ලංකාවෙහි ව්‍යාප්තව පැවැතියා වූ ආගමික විශ්වාසයන් බොහෝමයක්ම පැරණි ඉන්දියානු ආගමික විස්වාසයන්ට සමානය. ඒ අනුව බ්‍රාහ්මණාගම, ජෛනාගම, ශ්‍රමණ, වෘක්ෂ දේවතා වන්දනාව, යක්ෂ සහ නාග ඇදහිලි[23] ඒ අතර දක්නට ලැබේ. එමනිසා මෙරට සිටි ජනයා බුදුදහම පිළිබඳ නොදැන සිටින්නට ඇතැයි සිතිය නොහැක. එනමුදු මහාවංශයේ හෝ වෙනත් මූලාශ්‍රයන් මහින්දාගමනයට පෙර ලක්දිව බුදුසමය පැවතිණැයි සිතීමට අනුබල නොදෙයි.

නොදුටු මිත්‍රයෙක්[24] වූ ලක්දිව රජු වූ දෙවනපෑතිස්සට අශෝක අධිරාජයා මහා අරිට්ඨ කුමාරයා අත තෙරුවන් සරණ යන ලෙස දන්වා එවීමෙන් පැහැදිලි වන්නේ තෙරුවන් සම්බන්ධයෙන් අරිට්ඨ ඇතුළු පිරිස ස්වකීය රජුට නිවැරදිව වටහා දීම සඳහා දැන සිටිය බවක්ය.[25] දිවයිනට ඒමට පෙර ඇතැම් විට අරිට්ඨ ඇතුළු පිරිස තෙරුවන් සරණ ගිය බෞද්ධයන් බවට පත්කරන්නට ඇත. ඒ කෙසේ වෙතත් අරිට්ඨ ඇතුළු පිරිස යථෝක්ත පණිවුඩය රැගෙන ආ හෙයින් මහින්දාගමනයට පෙර යම්කිසි ආකාරයකින් බුදුසමය මෙරටට ව්‍යාප්ත වන්නට ඇතැයි තවත් සනාථ වෙයි.



අශෝක අධිරාජයාගේ ඇතැම් ලිපිවල එන "තම්බපණ්ණි" යනු ශ්‍රී ලංකාව ලෙසත් දකුණු ඉන්දියාවෙහි තින්නවේලි දිස්ත්‍රික්කයෙහි "තාම්‍රපර්ණි" ගඟ අසබඩ ප්‍රදේශයක් යැයි යනුවෙනුත් ඇතැම් උගතුන් අතර මත දෙකක් දක්නට ලැබේ.[26] අශෝක ගිරි ලිපිවල සඳහන් "තම්බපණ්ණි" යනු ශ්‍රී ලංකාව වශයෙන් පිළිගත්හොත් ඔහුගේ ධර්ම විජය හා සමාජ සුභසාධන කටයුතු තම්බපණ්ණියේ සාර්ථක වූයේය යනුවෙන් සඳහන් හෙයින් එම ධර්ම විජය කටයුතු හා සමාජ සුභසාධන කටයුතුවලට සම්බන්ධ පිරිස් ශ්‍රී ලංකාවට පැමිණියේ යැයි පිළිගැනීමට සිදුවේ. "ධර්ම විජය" ප්‍රතිපත්තියෙහි සඳහන් "ධර්මය" ප්‍රධාන වශයෙන් බුදුදහමෙන් පෝෂණය වූවකි. අනෙක් අතට ශ්‍රී ලංකාවට එසේ පිරිස් පැමිණියේ නම් ඔවුන් අතර බෞද්ධ ප්‍රතිපත්ති අනුගමනය කරන්නන් ද සිටින්නට ඇත. ධර්ම විජය පිළිබඳ ගිරි ලිපිවල සඳහන් වන්නේ එය අශෝක රජුගේ 8 වෙනි වසරෙහි සිදු වූ බවයි. අශෝක රජු විසින් දියත් කරන ලද ධර්ම විජය කටයුතු දෙවතාවක දී සිදුකළා සේ සලකන්නට සිදුවේ.මක්නිසාද මේ සම්බන්ධ ගිරිලිපි දෙයාකාරයක පිරිස් දෙවතාවක දී ශ්‍රී ලංකාවට පැමිණ ඇතැයි පෙනෙයි. ශ්‍රී ලංකාවට නිල වශයෙන් බුදුදහම හඳුන්වා දුන් මහින්ද හිමියන් ප්‍රමුඛ දූත පිරිස පැමිණියේ අශෝක රජුගේ 17 වන වසරේ පැවැත් වූ තෙවන ධර්ම සංගීතියෙන් පසු ඔහුගේ 18 වන වසරේදීය. ඒ අනුව ඉහත අවස්ථා දෙකෙහි පිරිස මිහිඳු හිමියන් පැමිණීමට වසර 10 කට පමණ පෙර ශ්‍රී ලංකාවට පැමිණ ඇත. එයින් ගම්‍ය වන්නේ මිහිඳු හිමියන් පැමිණීමට පෙර දෙවතාවක දී පැමිණි පිරිස් වෙතින් බුදුදහම පිළිබඳ දැනීම ශ්‍රී ලංකාවට ලැබෙන්නට ඇතැයි සිතිය හැකි වීමක්[27] යනුවෙන් ආචාර්ය උදිත ගරුසිංහ මහතා පවසයි.

පණ්ඩුවාසුදේව රජතුමා බුදුදහම පිළිබඳ දැන සිටි බවට අනුමාන කළ හැකිවන්නේ පඬුවස්දෙව් ශ්‍රී ලංකාවට පැමිණීම ගැන "නිමිති කියන්නන්" විසින් එකී පරම්පරාවෙන් අනාගතයෙහි දී බුදුදහම ප්‍රතිෂ්ඨාපනය කරන බව කියන ලද ප්‍රකාශනයෙනි.[28]

මහාවංසයට අනුව පණ්ඩුකාභය විසින් විවිධ ආගමික පූජ්‍යයන් සඳහා නොයෙකුත් ස්ථානයන්, ගොඩනැගිලි ඉදිකරණු ලැබුවත් බුදුසමය ඒ ආගම්වලට අන්තර්ගත නොවීය.[29] බුදුසමය සම්බන්ධයෙන් ලක්දිව ජනයාට අදහසක් ඒ වන විටත් තිබුණ ද ඇතැම් විට වංසකථාකරුවන් එය හිතාමතාම සඳහන් නොකළා විය හැකිය. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන වල්පොල රාහුල හිමියෝ එකළ දිවයිනෙහි බෞද්ධ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍යතාවක් නොමැති වූ බව පවසති.[30] නමුත් එය පිළිගැනීමට අපහසු වන්නේ මේ කාලය වනවිට අනෙකුත් ඇදහිලි සම්බන්ධයෙන් ආගමික ගොඩනැගිලි ඉදිව ඇති බවට සාක්ෂි නිසාය.[31]

බුදුන්ගේ පළමු ලංකාගමනයේ දී සුමනකූටයේ මහා සුමනසමන් දෙවියාට පූජාර්හ වස්තුවක් ලෙස උන්වහන්සේගේ කේශධාතු ඔහුට දුන් අතර ඔහු ඒවා නිධන් කර දාගැබක් තැනවූවා සේම බුද්ධ පරිනිර්වාණයෙන් පසු සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යයකු බුදුන්ගේ ග්‍රීවා ධාතුව එම චෛත්‍යයේම නිදන් කරවන ලද බවත් සඳහන් වේ. එසේම දුට්ඨගාමිණී රජු බුදුන් වහන්සේගේ පළමුවැනි ලංකාගමනයේ දී පා තබන ලදැයි සැළකෙන ස්ථානයක ඉදිකෙරූ ස්මාරකයක නෂ්ටාවශේෂ සම්බන්ධයෙන් මහාවංශයේ සඳහන් වේ.[32] මහියංගණය සහ ගිරිහඬුසෑය[33] සම්බන්ධයෙන් එන පුරාවෘත්ත අනුව එම චෛත්‍යය දෙකම බුද්ධකාලීනව ගොඩනැගුණු ඒවා බව පැවසෙයි. නමුත් මෙම වාර්තා පුරාවිද්‍යාඥයින් පිළිගැනීමට මැලිවෙති.[34]

මලලසේකර මහතාට අනුව මහින්දාගමනයට පෙර මෙරට ජනයා බුදුන් හෝ උන්වහන්සේගේ ධර්මය හෝ පිළිබඳව නොදැන සිටිය බව සිතීම සාවද්‍ය බවත් ඊට පටහැනි සාධක තිබෙන බවත් ඔහු සඳහන් කරයි.[35] බුදුන්ගේ පළමුවන ලංකාගමනය පිළිබඳව එන පුවත පවා සාම්ප්‍රදායිකව පැවැත ආවක් වුවද එහිදී ඓතිහාසිකභාවය අවිනිශ්චිත යැයි තවදුරටත් මලලසේකර මහතා පවසයි.[36]



ශ්‍රී ලංකාවෙහි බුදුදහම ව්‍යාප්ත වීමේදී ශ්‍රී ලාංකිකයන් ඒ සඳහා කෙබඳු ආකාරයකට අනුකූලතා දැක්වූවාද යන්න සාහිත්‍යය මූලාශ්‍ර මඟින් පැහැදිලි වේ. මිහිඳු හිමියන්ගේ පළමුවැනි ධර්මදේශනාව ශ්‍රවණය කිරීමෙන් අනතුරුව රජු ඇතුළු සතළිස් දහසක් පිරිස තිසරණ ගත බෞද්ධයන් වූ බව කියනු ලැබේ. බුදුසමය ඉතාම සීඝ්‍රයෙන් මෙරට ජනප්‍රිය වූ බවක් පෙනෙයි. මේ අනුව පෙනීයන කාරණයක් වන්නේ එකල ශ්‍රී ලාංකේය ජනතාව යම්කිසි ආකාරයකට දැන සිටි බුදුසමය මහින්දාගමනයත් සමඟ රාජ්‍ය අනුග්‍රහය සහිතව මෙරට ස්ථාපිත වූ බවය.[37] පුරාතන කාලයේ සිටම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සබඳතාවයක් තිබූ බැවින් බෞද්ධාගම සම්බන්ධිත අදහස් ශ්‍රී ලංකාව තුළ තිබෙන්නට ඇති බවක් දක්නට ලැබුන ද ශාසනයක් පැවැතියේ යැයි ස්ථිරවම කිව නොහැකිය.[38]

## ආන්තික සටහන්

1. **Inscription of Ceylon,** Vol. II, part, I, ed. S. Paranavitana, Colombo: Department of Archaeology, No. 21, 1983, P.35; S.Paranavithana, An Inscriptions of Circa 200 B.C; at Rayagala Commemorating saint mahinda, **University of Ceylon Review,** Vol. XX, No.2, 1962, PP. 159- 162; **Epigraphia Zeylanica,** Vol.
2. දීපවංස, සංස්. කිරිඇල්ලේ ඥානවිමල හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. 1959, පරි. 12, ගා. 21, ඌණපූරණ සහිතො මහාවංසො, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 122, ගා. 26, සමන්තපාසාදිකාව, සංස්. සයිමන් හේවාවිතාරන, කොළඹ: ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය, 1900, පි. 26.
3. ''සෝවාන් පලයට පත්වනු ලැබූ සුමන සමන් බුදුරදුන්ගේ කේශධාතු තැන්පත්කර ථූපයක් කළේය. පසුකළ බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සරභූ හිමියන් සර්වඥ ග්‍රිවාස්ථි ධාතුව තැන්පත් කර දොළොස් රියන් උස දා ගැබක් කරවිය'', ථූපවංස, පරි. 1, ගා. 34.-39, ගා. 69-.70, සමන්ත, පි. 52.
4. වල්පොල රාහුල හිමි, ලංකාවේ බුදුසමයේ ඉතිහාසය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1962, පි. 80; ඊ.ඩබ්. අදිකාරම්, පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, කොළඹ: ජේ.කේ.ජී. ජයවර්ධන සහ සමාගම, 1963, පිටු.115-.120.
5. ථූපවංස, පරි. 1; සමන්ත, පි. 52.

6. ඌපූම, පරි. 1, ගා. 19.-77.

7. සමන්ත, පි. 52.

8. ජී.පී. මලලසේකර, ලංකා පාලි සාහිත්‍ය, කොළඹ: ඇම්.ඩී. ගුණසේන ප්‍රකාශකයෝ, 1965, පි. 1.

9. අදිකාරම්, එම, 1963, පි. 116.

10. එම, පිටු. 116-.117.

11. ''ලංකායං විජයසනාමකෝ කුමාරො - ඔතිණෙණා ථිමතී තබ්බ පණ්ණිදිපෙ සාලානං යමකුගුණන මන්තරස්මිං - නිබ්බාතුං යසිතදිනෙ තථාගතස්ස'' ඌපූම, පරි. 7, ගා. 47.

12. ''පරිනිබ්බාන සමයේ සම්බුදෙධා දීපදුත්තමෝ - සිහබාහුස්සායං පුතෙතා විජයො නාම ඛත්තියෝ ලංකාදීපං අනුප්පතෙතා ජහෙත්වා ජම්බුදීපකං - බ්‍යාකාසි බුද්ධසෙටෙඨා සො රාජා හෙස්සති ඛත්තියෝ'' දීප, පරි.9, ගා. 21.-22.

13. ''අජායතතුස්ස හි අට්ඨමෙ වස්සෙ - සම්මා සම්බුද්ධො පරිනිබ්බායි තසමායෙ ච වස්සෙ සීහකුමාරස්ස පුතෙතා තමබපණ්ණි - දීපමාගත්වා මනුස්සාවාසං අකාසි'' සමන්තඃ පි. 42.

14. උදිත ගරුසිංහ, ප්‍රාග් මහින්ද ශ්‍රී ලංකාවේ බෞද්ධ තත්වය, සම්මානි, සංස්. ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හා කොටගම වාචිස්සර හිමි, වැල්ලම්පිටිය: ප්‍රෙස් (පුද්ගලික)

15. මලලසේකර, එම, 1965, පි. 3.

16. අමරදසලියනගමගේ සහ රණවීර ගුණවර්ධන, අනුරාධපුර යුගය, කොළඹ: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1987, පි. 46.

17. ''අට්ඨ රසනතං සෙණිනං සහස්සංච කුලානිසො ලෙඛං දත්වාන පෙසෙසි විජයස්ස'', ඌපූම, පරි. 7, ගා. 57.

18. Walpola Rahula, **History of Buddhism in Ceylon**: The Anuradhapura Period 3rd Century B.C. to 10th Century A.D., Colombo: M.D. Gunasena & Company, 1956, p. 48.

19. ඌපූම, පරි. 7, ගා. 18-.22.

20. **Sutta Nipata Attha Katha,** ed. Helmer Smith, Vol. I, London: Pali Text Society, 1938, pp. 356-357.

21. ඌපූම, පරි.7. ගා. 24.

22. මලලසේකර, එම, පි. 6.



23. ''පරං ජෝතියගෙහම්හා ඔරං ගාමණිවාපියා - සො පරිබ්බාජකාරාමං කාරාපේසි තථෙවච ආජිවකානං ගෙහඤ්ච බ්‍රාහ්මණමං මෙවච - සිවිකාසොත්ථිසාලාච අකාරසි තහිං තහිං.'' ඌපූම, පරි. 10, ගා. 101-.102; paranavitana, **op.cit.** 1929, Vol. XXI, PP. 302-327.

24. සමන්ත, පි. 43; **University of Ceylon History of Ceylon** (UCHC), ed. Prof. H.C. Ray, S.Paranavitana, Colombo, 1960, Vol. I, Part. I,P.135; Paranavitana, Two Royal of the Tittles of Early Sinhalaese and the kingship in Ancient Ceylon, **(JRAS)**, Colombo, 1939, pp. 443-462.

25. ඌපූම, පරි. 11, ගා. 34-.35.

26. Rahula, **op.cit.** 1993, p.10.

27. ගරුසිංහ, එම, 2005, පිටු. 220-221.

28. ඌපූම, පරි. 8, ගා. 14-.15.

29. එම, පරි. 10, ගා. 73.-74.

30. රාහුල හිමි, එම, 1962, පිටු. 45-.50.

31. මල්ලවආරච්චි, එම, 2005, පි. 24.

32. ඌපූම, පරි. 10, ගා. 40.-43.

33. **UCHC,** p.137.

34. Rahula, **op.cit.** 1993, P.49.

35. G.P. Malalasekara, **Pali Literature of Ceylon,** Colombo: M.D. Gunasena & Company, 1956, p. 13; **Epigraphia Zeylanica,**Vol. IV, ed. S. Paranavitana, London: Oxford University Press, 1944,P. 155.

36. **UCHC,** pp.136-137.

37. මල්ලවආරච්චි, එම, 1993, පි. 20.

38. හඟුරන්කෙතධීරානන්ද හිමි, පුරාතන ශ්‍රී ලාංකේය සංඝ සංවිධානය සහ එහි ව්‍යුහාත්මක පදනම, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, පි. 95.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 OCT 2017
පුස්තකාලය